ඉතාලියේ වෙරෝනා නගරයේ වාසය කළ ශ්‍රී ලාංකික පවුලක සිදුවූ ඝාතනයක් හා දිවි තොර කරගැනීමක් පිළිබඳ පසුගිය සතියේ වාර්තා විය. මුල් පුවත් වාර්තා වලින් අනාවරණය වූයේ, මවක් තම දරුවන් දෙදෙනා ඝාතනය කර පළා ගොස් ඇති බවටයි. නව තොරතුරු එක්කරමින් පසුගිය සති අන්ත පුවත්පත් කිහිපයක් - (සිළුමිණ (10/31), ඉරිදා දිවයින (10/31), ඉරිදා ලංකාදීප (10/31), සහ සන්ඩේ අයිලන්ඩ් (10/31) - වාර්තා කළේ, එම මව තම දිවි තොර කරගෙන ඇති බවටයි.

ඝාතන සිදුවීමක් හා බැඳි දිවි තොර කරගැනීමකට සාපේක්ෂව වඩාත් වැඩි අවධානයක් යොමු වේ. ඒ නිසාම, දිවි තොර කර ගැනීම් වාර්තාකරණය සඳහා වන මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව එවැනි පුවතක් වාර්තා කිරීම අත්‍යාවශ්‍ය වේ. උදාහරණ ලෙසින්, පහත පුවත් වාර්තාවන්හි එම ආචාර ධර්ම කඩවීම් මෙසේ දැක්විය හැක.

1) මෙහි දිවි තොර කරගත් ආකාරය දක්වා තිබුණි. දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු අනුකාරක දිවි තොර කරගැනීමට යොමු වීම වළක්වාලීමට, දිවි තොර කරගත් ආකාරය නොදක්වා සිටීම උපකාරී වේ.

2) දිවි අහිමි කරගත් අයගේ ඡායාරූපය දක්වා ඇත. ඇතැම් විට දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයකින් සිටින අයෙකුට පසුකාලීනව හෝ එවැනි ඡායාරූප, දිවි තොර කරගැනීමට උත්ප්‍රේරකයක් ලෙසින් ක්‍රියා කිරීමට හැකියාවක් ඇත.

3) උපකාරක අංකයක් පළ කර නොතිබුණි. දිවි තොර කරගැනීමේ පුවතක් කියවීම තුළින් ඇති වන දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඔස්සේ යමෙකු ක්‍රියාත්මක වීම වැළක්විය හැක්කේ, එම පුවත තුළම උපකාරකද අංකද සඳහන් කිරීම තුළිනි.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
[https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...](https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...)
[https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...](https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...)